# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2305/12 - 2022 නොවැම්බර් මස 09 වැනි බදාදා - 2022.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277(1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරී ඒකනායක වීරකෝන් මුදියන්සේලාගේ ලලිත් ඒකනායක මහතා මෙයින් පත්කරමි.

මෙම නිලධාරියාට මෙම පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද කොමිසමක බලතල ඇත්තේ ය.

අද්මිරාල් ඔෆ්ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2022 නොවැම්බර් මස 09 වැනි දින,
කුරුණෑගල දී ය.

EOG 11 - 0082



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*